# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

## මහජනතාව වෙත කෙරෙන කාරුණික දැන්වීමයි

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ලෙස හැඟීයන ආකාරයට නාම පුවරු ප්‍රදර්ශනය කරමින්, ව්‍යාජ කාර්යාල පවත්වාගෙන යන බවටත්, එබඳු නාම පුවරු සහ VIP ලාංඡන සහිතව රථ වාහන භාවිතා කරන බවටත් අපවෙත තොරතුරු වාර්ථා වී ඇත.

මෙම ව්‍යාජ කණ්ඩායම් රථවාහන නීති උල්ලංඝණය කිරීම, නීති විරෝධී ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම, පොලිස් ස්ථානවල අත්අඩංගුවේ සිටින සැකකරුවන් සම්බන්ධයෙන් නීති විරෝධීව පොලිසියට බලපෑම් කිරිම, විවිධ සේවාවන් ලබාදෙන බව ප්‍රකාශ කරමින් මුදල් අය කිරීම වැනි නීති විරෝධි කටයුතු සිදුකරගෙන යන බව දැනට හෙලිවී ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ද තහවුරු කරන ලද ස්වාධීන කොමිෂන් සභාවකි. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවා ඇත. ඒ මඟින් ලබාදෙන සේවාවන් සඳහා කිසිදු මුදල් අයකිරිමක් සිදු නොකරන අතර, කොළඹ පිහිටි ප්‍රධාන කර්යාලයට අමතරව දිවයින පුරා ප්‍රාදේශීය කාර්යාල 10 ක් සහ උප කාර්යාල 03ක් හරහා අදාල සේවාවන් සපයනු ලැබේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ දැනට ක්‍රියාත්මක කාර්යාල සහ සම්බන්ධිකරණය කළහැකි තොරතුරු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| කොළඹ ප්‍රධාන කාර්යාලය | අංක 14, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 04 | 011 2505580 |
| අනුරාධපුරය | අංක 623/20 ඊ, ෆීමන් පාර, අනුරාධපුරය | 025 2234801 |
| අම්පාර | 4 වන සැතපුම් කණුව, උහන පාර, කරන්ගාව, අම්පාර | 063 2222340 |
| මඩකලපුව | අංක 46, කොවින්ටන් පාර, මඩකලපුව | 065 2224420 |
| ත්‍රිකුණාමලය | අංක 343. පවර්හවුස් පාර, ත්‍රිකුණාමලය | 026 2222607 |
| කල්මුණේ | කිට්ටන්කි පාර, මන්වානෙයි පාර, කල්මුණේ | 067 2229728 |
| යාපනය | අංක 1, තෙවන හරස් වීදිය, යාපනය | 021 2222021 |
| බදුල්ල | අංක 43/5, කුමාරසිංහ පාර, බදුල්ල | 055 2224594 |
| මාතර | අංක 9, රාහුල හරස් වීදිය, මාතර | 041 2226533 |
| මහනුවර | අංක 8/1, ප්‍රිම්රෝස් පටුමග, පේරාදෙණිය පාර, මහනුවර | 081 2205024 |
| වව්නියාව | අංක 26/2, පිටත වටරවුම් පාර, වව්නියාව | 024 2222029 |
| පුත්තලම | පරණ නගර සභා ගොඩනැගිල්ල, කුරුණෑගල පාර, පුත්තලම | 071 5663455 |
| මන්නාරම | අංක 121, රෝහල පාර, මන්නාරම | 023 3123906 |
| කිලිනොච්චි | පරණ කච්චේරි ගොඩනැගිල්ල, A9 පාර, කිලිනොච්චිය | 070 3654910 |

ඉහත දුරකථන අංක වලට අමතරව **1996** යන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්ෂණික දුරකතන අංකය පැය 24 පුරාම ක්‍රියාත්මකය.

**ඉහත ලිපිනයන් හි පිහිටි කාර්යාලයන්ට අමතරව වෙනත් කිසිදු ස්ථානයක ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්යාල පවත්වාගෙන යනු නොලැබේ. එසේම මෙම කාර්යාල වලට අමතරව කිසිදු අතරමැදි නියෝජිත ආයතනයක් හෝ අතරමැදි පුද්ගලයින් පත්කර නොමැති බව ශ්‍රී ලංකාවාසීන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.** එබැවින් ඉහත කී ආකාරයේ ව්‍යාජ පුද්ගලයින්ට සහ සංවිධානාත්මක කණ්ඩායම් වලට නොරැවටෙන ලෙසත්, අපගේ සේවාවන් ලබාගැනීමට අප කාර්යාලය සමඟ සෘජුවම සම්බන්ධ වන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමු.

ආචාර්ය ජගත් බාලසූරිය
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2021.05. 05